// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2151/55 – 2019 නොවැම්බර් මස 29 වැනි සිකුරාදා – 2019.11.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංක: IR/22/67/2009.

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2011.12.29 දිනැති හා අංක 1738/31 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2011.12.23 දින දරන නියෝගයෙන්, එක් පාර්ශවයක් වශයෙන් වැලිමඩ, දරගල, හෙලකඩේ, තුරු සෙවන හි පදිංචි එන්. ඩී. එන්. අබේසේකර මහතා සහා කොළඹ 05, කිරුළ පාර, අංක 200 පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2019.10.25 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2018 නොවැම්බර් මස 06 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05 දී ය.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

යොමු අංකය : IR/22/67/2009

කොළඹ 05 කම්කරු මහලේකම් කාර්යාලයේ පිහිටි
කාර්මික අධිකරණයේ දී ය,

එන්. ඩී. එන්. අබේසේකර මහතා,
"තුරු සෙවන",
හෙලකඩේ, දරගල,
වැලිමඩ.

ඉල්ලුම්කරු

*නඩු අංකය : ඒ/3430*

*එදිරිව*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය,
අංක 200, කිරුළ පාර,
කොළඹ 03.

*වගඋත්තරකරු*

*ප්‍රදානය*

කම්කරු සබඳතා හා ඵලදායී ප්‍රවර්ධන ගරු අමාත්‍ය ගාමිණී ලොකුගේ මැතිතුමා විසින් ලංකාවේ ව්‍යවස්ථාපිත අණ පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධන මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් එතුමා වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා එන්. ඒ. ජයවික්‍රම වන මා වෙත යොමු කර ඇත.

*පාර්ශවකරුවන් අතර ඇති කාර්මික ආරවුල සඳහා හේතු වී ඇතිතේ, ආරවුලට තුඩුදුන් කාරණය*

01. 2009.01.18 වැනි දින පැමිණිලිකාර එන්. ඩී. එන්. අබේසේකර මහතාගේ වැඩ තහනම් කර ඇති අතර, දින දහතරක් ඇතුළත චෝදනා පත්‍රය නිකුත් නොකිරීම.

02. 2009.05.21 වැනි දින චෝදනා පත්‍රය නිකුත් කර ඇතතේ, විනය පරීක්ෂණ ක්‍රියාවලියට අනුව මාස තුනක් ඇතුළත විනය නියෝග නිකුත් නොකිරීම.

03. 2009.04.27 වැනි දින සිට 2010.02.11 වැනි දින දක්වා මාස නවයක කාලයක් සාධාරණ හෝ යුක්ති සහගත හේතු රහිතව වැඩ තහනම් කර රැඳවීම තුළ ඔහුට සිදුව ඇති අසාධාරණය හා අදළ කාලය සඳහා හිඟ වැටුප් නොගෙවීම.

පාර්ශවකරුවන් විසින් තම තමන්ගේ ප්‍රකාශන ඉදිරිපත් කිරීමෙන් පසු මෙම ආරාවුල විමසීම සඳහා නියම කොට ඇත. ඉල්ලුම්කාර පාර්ශවය මූලිකව නියෝජිතයෙකු සමග පෙනී සිටි අතර, පසුව තමා වෙනුවෙන් තමාම පෙනී සිට ඇත. වගඋත්තරකාර පාර්ශවය වෙනුවෙන් ආයතන නීති නිලධාරි උපදෙස් මත රජයේ නීතිඥවරු පෙනී සිට ඇත. මෙම නඩුව විමසීමේ කටයුතු ආරම්භ කිරීමට පෙර සමථයක් කිරීමට හැකියාව තිබේ දැයි සලකා බලන ලද මුත් දෙපාර්ශවය අතරේ සමථයක් ඇති කරලීමට නොහැකි වූයෙන් විමසීමේ කටයුතු ආරම්භ කරන ලදී.

නඩු වාර්තාවට ඉදිරිපත් වී ඇති සාක්ෂි හා ලේඛන පරීක්ෂා කර බැලීමේ දී මෙම ඉල්ලුම්කරුගේ සේවය තහනමට ලක් කර ඇත්තේ වැලිමඩ බස් ගාලේ මාණ්ඩලීය භූමිය තුළ ලොතරැයි අළෙවි කුටියක් පවත්වාගෙන යන ශාන්ත කුමාර නමැති පුද්ගලයෙකුගේ මාණ්ඩලීය පිළිවෙතට පටහැනිව ව්‍යාජ බිල්පතකින් මුදල් අයකර එම මුදල් තම අභිමතය පරිදි පරිහරණය කිරීමෙන් බරපතල වරදක් කර ඇත යන පදනම මතය.

කෙසේ වෙතත් ඉල්ලුම්කරු ඔහුට විරුද්ධව ඉදිරිපත් කර ඇති චෝදනා සම්බන්ධයෙන් මෙම නීති කෘතයේ දී කිසිඳු ඉල්ලීමක් කර නොමැත. ඉල්ලුම්කරු හබ කරනු ලබන්නේ වැඩ තහනමට ලක් කර දින සිට දින දාහතරක් ඇතුළත චෝදනා පත්‍රය නිකුත් නොකිරීමත්, මාස තුනක් ඇතුළත විනය නියෝගය නිකුත් නොකිරීමත් හා 2009.04.27 වැනි දින සිට 2010.02.11 වැනි දින දක්වා යුක්ති සහගත හේතු රහිතව වැඩ තහනම් කර රැඳවීම තුළ ඔහුට සිදුවී ඇති අසාධාරණය හා වැඩ තහනම් කර සිටි කාලයට හිඟ වැටුප් නොගෙවීමත් සම්බන්ධයෙන් බව මා වෙත විසඳීම සඳහා ඇති යොමු කිරීමේ සඳහන් කරුණු මගින් පැහැදිලි වේ.

ආයතන ව්‍යවස්ථා මාලාවේ 4.3 වගන්තිය යටතේ දින 14 ක් ඇතුළත චෝදනා පත්‍රය නිකුත් නොකිරීම හා 4.6 වගන්තිය යටතේ සඳහන් කර ඇති පරිදි මාස 3 ක කාලයක් ඇතුළත විනය පරීක්ෂණයක් අවසන් නොකිරීමත් හා යුක්ති සහගත හා සාධාරණ හේතු රහිතව සේවා තහනමට ලක්කර සිටි කාලය සඳහා අහිමි කරන ලද වැටුප ලබා නොදීම යන කරුණු සම්බන්ධයෙන් පමණක් ඉල්ලුම්කරු හබ කරන බව පැහැදිලි වේ.

ආයතන ව්‍යවස්ථා මාලාවේ 4.3 වගන්තියේ අනිකුත් කරුණු අතර පහත සඳහන් ලෙස දක්වේ. "හැකිතරම් දුරට සේවය තහනම් කරන අවස්ථාවේදී ම හෝ සේවය තහනම් කළ දින සිට දින 14 ක් ඇතුළත දී හෝ ... චෝදනා පත්‍රය නිකුත් කළ යුතු බවට සඳහන් ව ඇත. "

එමෙන්ම 4.6 වගන්තියට අනුව මාස 3 ක කාලයක් ඇතුළත විනය පරීක්ෂණය අවසන් කළ යුතු බවට සඳහන් කර තිබුණ ද, නොවැළැක්විය හැකි හේතූන් මත තෙමසක් ඇතුළත් විනය විභාගය අවසන් කිරීමට නොහැකි වුවොත් ප්‍රමාදයට හේතු දක්වමින් ඒ පිළිබඳ ව සේවක මණ්ඩල කළමනාකරුට දැන්විය යුතු ය, යනුවෙන් එහි තවදුරටත් සඳහන් කර ඇත.

සේවය තහනම් කිරීම සම්බන්ධයෙන් ආයතන විනය ව්‍යවස්ථා මාලාවේ 6.1 වගන්තියේ සඳහන් කර ඇත. එහි වරදේ ස්වභාවය අනුව සේවා තහනමට ලක් කළ කාලය තුළ අර්ධ වේතන ලබා දීම හෝ වේතනය සම්පූර්ණයෙන් අත්හිටුවීමට හැකි බවට සඳහන් කර ඇත. එකී වගන්තියේ තවදුරටත් මෙසේ සඳහන් වෙයි. " කෙසේ වෙතත් විභාගය අවසානයේ දී සේවයෙන් පහ කිරීමට හෝ සේවය අවසන් කිරීමට වඩා අඩු දඬුවමක් පමුණුවන ලද හෝ නොගෙවන ලද මුළු වැටුප හෝ ඉන් කොටසක් හෝ ආපසු ගෙවීමට නියමිත බලධරයාට නියෝග කළ හැකි ය. එලෙස ගෙවීමක් සිදුකරන්නේ නම් බලධරයා විසින් එසේ නියෝග කළ යුතු බව පැහැදිලි ය.

එමෙන්ම එකී 6.1 වගන්තියේ තවදුරටත් මෙසේ ද සඳහන් වේ.

"එනමුත් චූදිත සේවකයා මුළුමනින් ම චෝදනාවලින් නිදහස් වුවොත් නියමිත බලධරයා විසින් සේවකයා වහාම සේවයෙහි ප්‍රතිෂ්ඨාපනය කිරීමටත් සේවය තහනම් කර සිටි කාලය තුළ දී නොගෙවන ලද සම්පූර්ණ වැටුප ගෙවීමටත් නියෝග කළ යුතු ය." යනුවෙන් ද සඳහන් වේ.

චූලිත සම්බන්ධයෙන් ලබා දී ඇති විනය නියෝගයේ දී විනය විභාගයේ දී සිදුවූ ප්‍රමාද දෝෂය සැළකිල්ලට ගෙන සේවය තහනම් කර සිටි කාලයට නොගෙවූ වේතන අහිමි කරමින් හා ඉදිරියට මාස 03 කට සේවය තාවකාලිකව අත්හිටුවමින් ශ්‍රී ලංගම බණ්ඩාරවෙල ඩිපෝවට ස්ථාන මාරු කරමින් දඬුවම් නියම කර ඇත. චූදිත විසින් මෙම නියෝගයට එරෙහිව අභියාචනයක් ඉදිරිපත් කර ඇති අතර, එකී අභියාචනය ද නිශ්ප්‍රභා කර ඇත.

මෙම ඉල්ලුම්කරු සම්බන්ධයෙන් ඉදිරිපත් වී ඇති සාක්ෂි සලකා බැලීමේ  දී විනය විභාගයේ දී ඉල්ලුම්කරු සියලුම චෝදනාවලින් නිදහස් වී නොමැති බව පෙනී යයි. ශ්‍රී ලංගම කැප්පෙටිපොල ඩිපෝව මගින් කලක සිට භාවිතා කරන මෙම බස් ගාලේ පවත්වාගෙන යන ලොතරැයි කුඩුව පවත්වාගෙන යන අයගෙන් ඒ සඳහා කුලී මුදල් අයකර ලංගම දෛනික ආදයමට ලබා ගෙන වෙනම ලේඛනයක් යටතේ බස් ගාලේ පිරිසිදු කිරීමේ කටයුතුවලට හෝ වෙනත් සුභසාධක කටයුතුවලට යොදගත් බව, ඉල්ලුම්කරු තම සාක්ෂියෙන් පිළිගෙන ඇත. තවද ඔහු විසින් ඉදිරිපත් කර ඇති ලිඛිත දේශනයේ ද ඒ බව සඳහන් කර ඇත. මේ අනුව ලොතරැයි කුඩුවෙන් මුදල් අයකර ඔහුගේ අභිමතය පරිදි වැය කර ඇති බව ඉල්ලුම්කරුගේ පිළිගැනීම තුළින්ම තහවුරු වී ඇත.

මෙකී කරුණ සාධාරණීකරණය කිරීම සඳහා ඉල්ලුම්කරු කියා සිටින්නේ, ඉල්ලුම්කරු විසින් මෙම මුදල් සාමාන්‍ය ගිණුමකට අයකර පොදු කටයුතු සඳහා වැය කරන ලද්දේ එවකට පැවති ඩිපෝවේ දුර්වල ආර්ථික තත්ත්වය සැළකිල්ලට ගෙන ලංගම සේවකයෙකු ලෙස සද්භාවයෙන් බව ය. මෙම කරුණු තහවුරු කිරීමට කිසිඳු සාක්ෂියක් ඉදිරිපත් කර නැත. තව ද මෙම භූමිය ලංගමයට අයත් භූමියක් නොවන බවටත් සඳහන් කර ඇත.

කෙසේ වෙතත් එය එසේ වූයේ වුවත්, ලංගම සේවකයෙකු ලෙස අන්සතු දේපළක් මත පිහිටා ඇති වෙළෙඳ කුටියකින් ඔහුගේ අභිමතය පරිදි මුදල් අය කිරීම හා ඔහු කියන ආකාරයට එම මුදල් ලංගම කටයුතු සඳහා යොද ගැනීමට ඔහුට නෛතික අයිතියක් තිබේ ද යන ගැටළුව ඕනෑම සාධාරණ බුද්ධියකින් යුතු පුද්ගලයෙකුගේ සිතට පැන නගින බවට කිසිඳු සැකයක් නොමැත. කෙසේ වෙතත් ඉල්ලුම්කරුගේ එම තත්ත්වය තහවුරු කිරීමට හෝ ප්‍රමාණවත් සාක්ෂියක් මෙම නඩුවේ දී ඉදිරිපත් කර නොමැත.

තමා සාධාරණ හා යුක්ති සහගත හේතු රහිතව වැඩ තහනම් කර රැඳවීම තුළ ඔහුට බලවත් අසාධාරණයක් වූ බවට සඳහන් කළ ද, ඒ බව තහවුරු කිරීමට ප්‍රමාණවත් කිසිඳු සාක්ෂියක් ඉල්ලුම්කරු විසින් ඉදිරිපත් කර නැත. තමාගේ ඉල්ලීම තහවුරු කිරීම සඳහා ප්‍රමාණවත් අදළ සාක්ෂි ඉදිරිපත් කිරීම ඉල්ලුම්කරුගේ වගකීම වේ. කෙසේ වෙතත් ඉල්ලුම්කරුට විරුද්ධව ඇති හා ඔහුගේ සේවා තහනමට හේතු පාදක වූ ද, චෝදනාව මත බස්ගාලේ පවත්වාගෙන ගිය ලොතරැයි කුඩුවෙන් මුදල් අයකර එය සාමාන්‍ය ගිණුමකට බැර කර, වැය කරන ලද බව ඉල්ලුම්කරු තම සාක්ෂියෙන් ම පිළිගැනීම තුළින් ම තහවුරු වී ඇති හෙයින් ඔහුට විරුද්ධව ඇති චෝදනා සැකයෙන් තොරව සනාථ වී ඇති බවට පිළිගත යුතු ය. ඔහු කියන ආකාරයට ඔහු විසින් මෙම කටයුත්ත සද්භාවයෙන් කරන ලැබුයේ වුව ද,  ඒ සඳහා ඔහුට නෛතික අයිතියක් නොමැති අතර, ඔහුගේ සේවා ක්ෂේත්‍රයෙන් පරිබාහිර වූ කටයුත්තක් කර ඇති බව පැහැදිලි ය.

සේවා තහනමට ලක් වූ සේවකයෙකු සම්බන්ධව විනය පරීක්ෂණ කටයුතු හැකි ඉක්මනින් අවසන් කිරීම යුක්ති සහගත හා සාධාරණ වන බව පිළිගත යුතු වුවත්, විවිධ හේතුන් මත මෙම ක්‍රියාදාමයන් ප්‍රමාද වී බොහෝ විට දැකිය හැකි ය. කෙසේ වෙතත්, මෙම ඉල්ලුම්කරුට විරුද්ධව පවත්වන ලද විනය විභාගය හිතාමතාම ප්‍රමාදයට ලක් කිරීමක් සිදුකර ඇති බවට කිසිඳු සාක්ෂියක් මඟින් තහවුරු කර නැත. තව ද ආයතන ව්‍යවස්ථා මාලාවේ සඳහන් පරිදි දින 14 ක් තුළ චෝදනා පත්‍ර නිකුත් කිරීමත්, මාස 3 ක කාලයත් තුළ විනය පරීක්ෂණ අවසන් කිරීම කළ යුතු බවටත්, කරන ලද සඳහන් කිරීම විනය ක්‍රියා පටිපාටිය සඳහා මාර්ගෝපදේශයක් (directory) ලෙස දැක්වෙන අතර, එහි නියත නියෝගයක් (Mandatory) සටහන් කර නොමැති බව පැහැදිලි ය.

ඉල්ලුම්කරුගේ සේවා තහනමට ලක් කිරීමට හේතුපාදක වී ඇති ඉහතින් විස්තර කර ඇති පරිදි ලොතරැයි කුටිය පවත්වාගෙන යන අයගෙන් මුදල් අයකර එය සාමාන්‍ය ගිණුමකට බැර කර, වැය කිරීම සම්බන්ධ චෝදනා තහවුරු වී ඇති හෙයින් ඔහුගේ සේවා තහනම සාධාරණ හා යුක්ති සහගත නොවන බවට තර්ක කිරීමට ඉල්ලුම්කරුට සාධාරණ අයිතියක් නොමැති බව මගේ විශ්වාසයයි. එමෙන්ම දඬුවම් කිරීමේ දී ප්‍රමාදය ද සැලකිල්ලට ගෙන ඇති බවට විශේෂයෙන් සඳහන් කර ඇත.

ඉහතින් සඳහන් කරන ලද කරුණු සියල්ල සලකා බැලීමේ දී ඉල්ලුම්කරුට සහන ලබා ගැනීමට හිමිකමක් නොමැති බවට නිගමනය කරමි. ඒ අනුව ප්‍රදානයක් නොකරමි. මෙය යුක්ති සහගත හා සාධාරණ නියෝගයක් බවට ප්‍රකාශ කරමි.

එන්. ඒ. ජයවික්‍රම,
බේරුම්කරු.

2019 ඔක්තෝබර් මස 25 වැනි දින,
කාර්මික අධිකරණයේ දී.

12 - 508

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.